# ශ්‍රී ලංකාවේ ආන්ඩුව පලාත් සභා මැතිවරනවලින් හිස් ජයක් ලබා ගනී

## Sri Lankan government wins a hollow victory in provincial elections

**කේ. රත්නායක විසිනි**
**2009 පෙබරවාරි 16**

පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස), මධ්‍යම පලාතෙන් පැහැදිලි බහුතරයක් සහිතව, සෙනසුරාදා පැවති ශ්‍රී ලංකාවේ පලාත් සභා මැතිවරන ජයගත්තේය. ඡන්ද දූෂන ක්‍රියා පිලිබඳ චෝදනාවලින් අනතුරුව පුත්තලම දිස්ත්‍රික්කයේ එක ඡන්ද මධ්‍යස්ථානයක යලි ඡන්ද විමසීමක් කැඳවා තිබීම හේතුකොටගෙන, අනෙක් පලාතේ -- වයඹ -- ප්‍රතිඵල නිවේදනය කෙරී නැත. කෙසේ වෙතත්, මේ වන තෙක් ප්‍රකාශයට පත්වී ඇති ප්‍රතිඵල මගින් පෙන්නුම් කෙරෙන්නේ, එජනිස එම පලාත් සභාවේ පාලනය ද දිනා ගනු ඇති බවයි.

ජනාධිපති මහින්ද රාජපක්ෂ, බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි සිය ආන්ඩුවේ වර්ගෝත්තමවාදී යුද්ධය යුක්තියුක්ත කරනු වස් මැතිවරන ප්‍රතිඵල වහාම ඩැහැගත්තේය. ඊයේ නිකුත් කල නිවේදනයකින්, ඔහු කියාපැවේ, මැතිවරනය "මව්බිමට ආදරය කරන සියල්ලන්ගේ ම ජයග්‍රහනයක්" මෙන්ම "රනවිරුවන් දිරිගැන්වීමක්" සහ ආන්ඩුවේ වැඩපිලිවෙල අනුමත කිරීමක් බවයි.

රාජපක්ෂගේ පුරසාරම් තිබිය දී ම, මැතිවරන ප්‍රතිඵල යුද්ධය හෝ ආන්ඩුවේ පිලිවෙත් අනුමත කිරීමක් නොවේ. සියල්ලටත් වඩා, එජනිසට ලැබුනු ඡන්දය පිලිබිඹු කලේ, යුද්ධයට විවෘතව සහයෝගය දෙන ප්‍රධාන විරුද්ධ පක්ෂ -- එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) -- වෙතින් මොන යම් හෝ විකල්පයක් ඉදිරිපත් නොවීමයි.

මැතිවරන ව්‍යාපාරය පැවැත්වුනේ භීතියේ, බියගැන්වීමේ හෝ යථා පරිමාන මාධ්‍ය වාරනයක දේශපාලන වාතාවරනය තුල ය. යුද්ධයට එරෙහි මොන යම් හෝ විරුද්ධත්වයක් හෝ ආන්ඩුවේ පිලිවෙත් පිලිබඳ මොන යම් හෝ විවේචනයක් රාජපක්ෂ සහ ඔහුගේ ඇමතිවරුන් විසින් හෙලා දකින ලද්දේ, ජාතික ආරක්ෂාවට වලකැපිමක් සහ "කොටි ත්‍රස්තවාදින්ට" සහයෝගය දීමක් ලෙසය. පසුගිය වසර දෙක තිස්සේ, ආරක්ෂක හමුදා සමග සහයෝගයෙන් ක්‍රියාත්මක වන ඝාතක කල්ලි විසින් මිනිසුන් සිය ගනනක් ඝාතනය හෝ "අතුරුදහන්" කරනු ලැබ ඇත.

එල්ටීටීඊයට එරෙහි හමුදාවේ ජයග්‍රහනවලට හුරේ දැමීමෙහිලා ආන්ඩුව සමග එක්වීම මගින්, විරුද්ධ පක්ෂ, යුද්ධය පමනක් නොව, එයින් ගලා ආ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි රුදුරු ප්‍රහාර සහ ආර්ථික පිලිවෙත් ද අනුමත කලහ. එජාප සහ ජවිපෙ, ජීවන තත්වයන් කඩාවැටීම අරබයා පුලුල්ව පැතිර පවත්නා අසහනයට ආයාචනා කිරීමට ප්‍රයත්න දැරූ නමුත්, යුද්ධයේ හා ගෝලීය ආර්ථික අර්බුදයේ බලපෑමට නොව ආන්ඩුවේ දූෂනවලට බැනවැදීමට ඔවුන්ගේ විවේචන සීමා විය.

යුද්ධය, වැඩෙන විරැකියාව, අත්‍යවශ්‍ය සේවාවන්ගේ පිරිහීම සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ප්‍රහාර සම්බන්ධයෙන් ඡන්දදායකයන්ගේ පුලුල් ස්ථර තුල පවත්නා විරසක හා සතුරු හැඟීම්වලට දේශපාලන සංස්ථාපිතය තුල කිසිදු හඬක් නොතිබුනි. රාජපක්ෂ මැතිවරනය "යුද්ධය පිලිබඳ ජනමතවිචාරනයක්" බවට පරිවර්තනය කල අතර එහිදී ඔහුට විරුද්ධ පක්ෂවලින් කිසිදු ප්‍රතිරෝධයක් එල්ල නොවුනි. 2002 දී එල්ටීටීඊය සමග ගිවිසුමක් අත්සන් කොට සාකච්ඡා ආරම්භ කල එජාපය, ආන්ඩුවේ මිලිටරි පිලිවෙත්, එනම් 2002 සටන් විරාමය ඉරා දැමීම සහ යුද්ධය යලි ඇරඹීම, සම්බන්ධයෙන් ආන්ඩුවට ප්‍රසිද්ධියේ ප්‍රශංසා කලේය.

මෙම සන්දර්භය තුල, ඡන්දදායකයන්ගෙන් සියයට 35ක් කොහෙත්ම ඡන්දයක් පාවිච්චි නොකිරීම තෝරාගත්තේය. තවත් කොටසක් එසේ කිරීමෙන් වලකාලන ලදි. හැඳුනුම්පත් හෝ අනන්‍යතා ලේඛන නැතිකම හේතුවෙන් අඩු ගනනේ 60,000ක් පමන වලංගු ඡන්දදායක පිරිසක් ඡන්දය දීමෙන් වලකාලන ලදි. ඔවුන්ගෙන් බොහෝ දෙනා, ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියේ වඩාත්ම පරිපීඩිත ස්ථර අතරට වැටෙන මධ්‍යම පලාතේ දෙමල කතා කරන වතු කම්කරුවෝය.

එජනිස, එජාපෙ සහ ජවිපෙ වියදමින්, මධ්‍යම පලාත් සභාව තුල සිය ආසන සංඛ්‍යාව, 2004 මැතිවරනයෙන් ලබාගත් 30 සිට 34 දක්වා ඉහල දමා ගත්තේය. වයඹ පලාතේ බොහෝ සෙයින් ග්‍රාමීය ප්‍රදේශයක් වන කුරුනෑගල දිස්ත්‍රික්කයේ ද සිය ආසන සංඛ්‍යාව 2004 දී තිබූ 20 සිට 24 දක්වා වැඩි කර ගනිමින්, වාසි ලබා ගැනීමට එජනිස සමත්ව ඇත.

වතු කම්කරුවන් විශාල බහුතරයක් ලෙස සිටින නුවරඑළිය-මස්කෙලිය ඡන්ද කොට්ඨාශය ජයගැනීමට එජනිස සමත් නොවීම අර්ථභාරීය. වතු කම්කරුවන්ගේ සම්ප්‍රදායික පක්ෂ දෙක වන ලංකා කම්කරු කොංග්‍රසය (සීඩබ්ලිව්සී) සහ කඳුරට මහජන පෙරමුන (යූපීඑෆ්) ඇතුලු පාලක සභාගය සම්බන්ධයෙන් එම ප්‍රදේශය තුල පුලුල්ව පැතිරුනු වෛරයක් හා සතුරුභාවයක් පවතී.

ආහාර හා සෙසු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මිල ගනන් අහස උසට නැගීම හේතුකොටගෙන වතු කම්කරුවන් බරපතල ලෙස පීඩාවට ලක්ව ඇති අතර වැටුප් හා සේවා තත්වයන් වැඩිදියුනු කර ගැනීම පිනිස තමන් ගත් කාර්මික ක්‍රියාමාර්ග කඩාකප්පල් කල සීඩබ්ලිව්සී හා යූපීඑෆ් සංවිධානවල ක්‍රියාකලාපය පිලිබඳව ඔවුහු වෛරීසහගතය. දෙමල විරෝධී වෙනස්කම්කිරීම්වලට මෙන් ම "කොටි ත්‍රස්තවාදීන්ට" සහයෝගය දීමේ චෝදනාව යටතේ පොලිසියේ හිරිහැරවලට හා වධබන්ධනයන්ට ද මෙම කම්කරුවෝ යටත් කෙරෙති.

මොන යම් හෝ මැතිවරන පසුබෑමක් සම්බන්ධයෙන් භීතියෙන් යුක්තව, රාජපක්ෂ, ඡන්දදායකයන් මිලට ගැනීමේ ප්‍රයත්නයක් ලෙස ප්‍රදේශයට රාජ්‍ය සම්පත් ගලාඑන්ට සැලැස්වීය. ඡන්ද විමසීමට යන්තම් දින දෙකකට පෙර, ආන්ඩුව වතුකරයේ යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා රුපියල් මිලියන 343ක් (එ.ජ. ඩොලර් මිලියන 3ක් පමන) වෙන් කලේය. සමහර ගමනාගමන මන්ඩල ඩිපෝවලට නව බස් රථ සැපයූ අතර නව ගොඩනැගිලි හා මාර්ග සඳහා මුල්ගල් තබන ලදි.

මෙම සියලු ප්‍රයත්න තිබියදීම, එජනිස නුවරඑළිය-මස්කෙලිය ඡන්ද කොට්ඨාශයේ ඡන්ද බහුතරයක් දිනාගැනීමට අසමත් විය. බොහෝ ඡන්ද එජාපයට ගියේය. ඒ එම විරුද්ධ පක්ෂයට දෙන ධනාත්මක සහයෝගයක් නිසා නොව, ආන්ඩුවට එරෙහි විරෝධයක් ලෙසය. ඡන්දය පාවිච්චි කලේ ලියාපදිංචි ඡන්දදායකයන්ගෙන් සියයට 68ක් පමනි. එයිනුත් සියයට 8ක් සිය ඡන්ද නිෂ්ප්‍රභා කොට තිබුනි. ඒ බොහෝ අවස්ථාවන්හිදී සමස්තයක් ලෙස දේශපාලන සංස්ථාපිතය ම සමග පවත්නා සිය වෛරය ප්‍රකාශයට පත් කිරීම පිනිසය.

එජාපයට පලාත් දෙකෙන්ම ආසන අහිමි විය. මධ්‍යම පලාත තුල දැන් එම පක්ෂයට ඇති ආසන ගනන, 2004 දී එයට තිබූ ආසන සංඛ්‍යාව වූ 26 සිට 22 දක්වා පල්ලම් බැස්සේය. අවසන් ප්‍රතිඵල තවමත් නිකුත් වීමට ඇති වයඹ පලාතේ කුරුනෑගල දිස්ත්‍රික්කයෙන් එජාපය දිනාගත් ආසන සංඛ්‍යාව 2004 දී එයට තිබූ ආසන ගනන වන 12 සිට යන්තම් 9 දක්වා පහල බැස ඇත. මධ්‍යම පලාතේ එජාප මහ ඇමති අපේක්ෂක එස්.බී. දිසානායක, "ජනතාව ආන්ඩුවේ යුද ප්‍රයත්නයට සහයෝගය දී" ඇතැයි පැමිනිලි කිරීම හැර, මේ තත්වය සම්බන්ධයෙන් කිසිදු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කොට නැත.

සිංහල අධිපතිවාදය ඇවිලවීම සහ දුප්පත් ජනයා ආරක්ෂා කිරීම පිලිබඳ ජනතාවාදී වාචාලත්වය සමග සෝෂාබද්ධ ලෙස යුද්ධය ආරක්ෂා කිරීමේ පිලිවෙත සංයෝග කරන ජවිපෙට, මැතිවරන ප්‍රතිඵල, ව්‍යසනකාරී පසුබැස්මක් විය. පක්ෂයට මධ්‍යම පලාත තුල තිබූ ආසන 12ම අහිමි වූ අතර, වයඹ පලාතෙන් ජවිපෙට ජයගැනීමට හැකි වන්නේ 2004 දී එය ලැබූ ආසන 6න් ආසන එකක් පමනක් -- කුරුනෑගල දිස්ත්‍රික්කය තුල -- බව පෙනී යයි. කුරුනෑගල හැරුනු විට, එහි ඡන්ද ප්‍රමානය සියයට 3ටත් වඩා පහලට කඩා වැටී තිබේ. මධ්‍යම පලාතේ එහි මහ ඇමති අපේක්ෂක සමන්සිරි ප්‍රනාන්දු ඡන්දදායකයන්ට බැන වදිමින්, ජනතාව ඔවුන්ගේ පක්ෂයට පසුපස හැරවීම මගින් "තමන්ටම අහිමි කර ගෙන" ඇතැයි ප්‍රකාශ කලේය.

2004 මැතිවරනවලට පෙරාතුව දශකයක් තිස්සේ, ප්‍රධාන ධනේශ්වර පක්ෂ දෙක -- එජාප සහ රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) -- සම්බන්ධයෙන් වැඩෙන මහජන විරසකභාවය මධ්‍යයේ, ජවිපෙ දේශපාලන සංස්ථාපිතය සඳහා ප්‍රයෝජනවත් ආරක්ෂක කපාටයක් ලෙස ක්‍රියාත්මක විය. ජවිපෙ 2002 සටන් විරාමයට දරුනු ලෙස විරුද්ධ වූ අතර ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග එජාප ආන්ඩුව බලයෙන් පහ කිරීමට සහයෝගය දුන්නේය. 2004 ජාතික හා පලාත් මැතිවරනවල දී එය එජනිස සමග සන්ධානගතව මැතිවරන ව්‍යාපාරයේ නිරත වූ අතර සැලකිය යුතු මැතිවරන ජයග්‍රහන ලබාගෙන කුමාරතුංගගේ ඇමති මන්ඩලයට එක්විය.

එතැන් පටන් ජවිපෙ බොහෝ සෙයින් සම්මුතිසහගත වී තිබේ. ඇමති මන්ඩලයට එක්වීමෙන් පසුව, එම පක්ෂය සිය මැතිවරන පොරොන්දු වහාම බිඳ දමා, විශාල වසයෙන් සිංහල ග්‍රාමීය ජනතාවගෙන් සමන්විත එහි සමාජ පදනම් අතර දරිද්‍රතාවෙන් බැට කන තම ජීවිත වැඩිදියුනු කර ගැනීමක් පිලිබඳව පැවති බලාපොරොත්තු සුන්කර දැමීය. 2005 ජනාධිපතිවරනයේ දී, ජවිපෙ රාජපක්ෂගේ ජයග්‍රහනය සඳහා උද්ඝෝෂනය කල අතර, එය විරුද්ධ පක්ෂයේ රැඳී සිටියත්, මහජන අයිතීන් පැහැර ගන්නා ආන්ඩුවේ අයවැය යෝජනා සම්මත කර ගැනීමට සහාය විය.

සිදී යන මහජන සහයෝගය, පසුගිය වසරේ දී ජවිපෙ තුල ව්‍යසනකාරී භේදයකට -- ආන්ඩුවෙන් පක්ෂය දුරස්ථ වනවාද නැද්ද යන්න මත -- තුඩු දුනි. ජවිපෙ පාර්ලිමේන්තු නායක විමල් වීරවංශගේ නායකත්වයෙන් යුක්ත කන්ඩායමක් රාජපක්ෂ තන්ත්‍රයට විවෘතව සහයෝගය දෙනු පිනිස පක්ෂයෙන් භේද විය. පලාත් සභා මැතිවරනවල දී, වීරවංශ, ජවිපෙට එරෙහි සිය තියුනුම ප්‍රහාර එල්ල කරමින්,

රාජපක්ෂ සමග එකට මැතිවරන ව්‍යාපාරයේ යෙදුනේය.

යුද්ධයට විරුද්ධ වෙමින් ද දිවයිනේ උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු ආරක්ෂක හමුදා වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කරන ලෙස ඉල්ලා සිටිමින් ද මැතිවරනයට මැදිහත් වූ එකම එකම පක්ෂය සමාජවාදී සමානතා පක්ෂය (සසප) විය. එහි අපේක්ෂකයන් පැහැදිලි කල පරිදි, පක්ෂයේ ඉල්ලීම එල්ටීටීඊයට හා එහි දෙමල බෙදුම්වාදී වැඩපිලිවෙලට දේශපාලන සහයෝගය දීමක් ඇගවුම් නොකල අතර එහි එල්ලය වූයේ, සමාජවාදී පිලිවෙත් මත පාදක වූ කම්කරු-ගොවි ආන්ඩුවක් සඳහා වන අරගලය තුල පාලක පන්තියේ සියලු පක්ෂවලින් ස්වාධීනව, කම්කරුවන් -- දෙමල, සිංහල හා මුස්ලිම් --- ඒකාබද්ධ කිරීමයි. දකුනු ආසියාව පුරා සහ ලෝක පරිමානව සමාජවාදය සඳහා අරගලයේ කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලාම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා වූ එහි කැඳවුම තුල සසප ඉදිරිදර්ශනය කැටි කර දැක්වුනි.

සසප දිස්ත්‍රික්ක දෙකකට තරග කලේ ය. එනම් වයඹ පලාතේ පුත්තලමට හා මධ්‍යම පලාතේ නුවරඑලියට ය. මැතිවරන උද්ඝෝෂන ව්‍යාපාරය තුල දී, පක්ෂයේ අපේක්ෂකයන්, සාමාජිකයන් හා ආධාරකරුවෝ, සිංහල, ඉංග්‍රීසි හා දෙමල භාෂාවලින් මුද්‍රිත, "ශ්‍රී ලංකාවේ සසප යුද්ධයට ද ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ප්‍රහාරයන්ට ද විරුද්ධව පලාත් සභා මැතිවරනය තරග කරයි" යන සසප ප්‍රකාශයේ පිටපත් 40,000ක් පමන මෙන් ම, *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* පලවූ සෙසු ලිපි, ප්‍රකාශ සහ අටුවා ලිපි ද බෙදා හැරියහ.

සසප උද්ඝෝෂනය හිස් පොරොන්දු හෝ මැතිවරන උපාමාරු මත පාදක නොවූ අතර එය එල්ල කෙරුනේ සිය අවශ්‍යතා ආරක්ෂා කරගත හැකි ක්‍රියාමාර්ගය හා ඉදිරිදර්ශනය කම්කරු පන්තියට සම්පාදනය කරනු පිනිසය. කම්කරු පන්තිය භේද කරනු පිනිස අනුප්‍රාප්තික ධනේශ්වර ආන්ඩු විසින් දශක ගනනාවක් තිස්සේ යොදාගනු ලැබ ඇති දෙමල විරෝධී වෙනස්කම් කිරීමේ පිලිවෙත තුල යුද්ධයේ ඓතිහාසික මූලයන් පවතින බව අපේක්ෂකයෝ පැහැදිලි කලහ. ඔවුහු ශ්‍රී ලංකාවේ තත්වය ධනවාදයේ ගැඹුරු වන ගෝලීය අර්බුදයේ සන්දර්භය තුල තැබූහ.

නිල මැතිවරන ව්‍යාපාරය තුල ආධිපත්‍යය දැරූ මිලිටරිවාදයට සෘජු ලෙස විරුද්ධව, සසප දිස්ත්‍රික්ක දෙකෙන් ම කුඩා නමුත් අර්ථභාරී ඡන්දයක් දිනාගත්තේය. නුවරඑලියෙන් පක්ෂයට ඡන්ද 98ක් ලැබුනි. ඒ සියල්ල ම පාහේ වතු කම්කරුවන්ගෙනි. පුත්තලමෙන් පක්ෂයට මේ වන තෙක් ඡන්ද 114ක් ලැබී ඇත. මේ සියල්ලම ලාභ ගරන පද්ධතිය විසින් නිර්මිත අර්බුදයට ද එහි දේශපාලන නියෝජිතයන්ට ද එරෙහි සමාජවාදී විකල්පයක් වෙනුවෙන් දෙන ලද පන්ති විඥාන ඡන්ද ය. අපගේ උද්ඝෝෂනයට සහාය දුන් සහ අපගේ අපේක්ෂකයන්ට ඡන්දය දුන් සියල්ලන්ගෙන් ම සසප ඉල්ලා සිටින්නේ, පක්ෂයේ ක්‍රියාමාර්ගය හා ඉදිරිදර්ශනය බැරෑරුම්ව අධ්‍යයනය කොට පක්ෂයට බැඳී දිවයින හා දකුනු ආසියානු කලාපය පුරා එය ගොඩනැගීමට එක්වන ලෙසයි.

© www.wsws.org